# සීමාසහිත පොල්ගහවෙල සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකුව

## ඉතුරුම් තැන්පත් අයදුම්පත

| | |
|---|---|
| ගිණුම් අංකය | |
| කළමණාකරුගේ කෙටි අත්සන | |

.......................................... ශාඛාව

කළමණාකරු,
සීමාසහිත පොල්ගහවෙල සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකුව.

දිනය :- ...............................

මහත්මයාණෙනි,

පහත සඳහන් පරිදි මාගේ/අපගේ නමට/නම්වලට තනි/හවුල් ගිණුමක් විවෘත කර දෙන මෙන් ඉල්ලමි/ඉල්ලමු.

(I) සම්පූර්ණ නම :..........................................................................................................
..........................................................................................................
ලිපිනය :..........................................................................................................
..........................................................................................................
හැඳුනුම්පත් අංකය :.............................................නිකුත් කළ දිනය :..................................
උපන් දිනය :.............................................දුරකථන අංකය :..................................
ගණුදෙණුකරු අංකය:.............................................

(II) සම්පූර්ණ නම :..........................................................................................................
..........................................................................................................
ලිපිනය :..........................................................................................................
..........................................................................................................
හැඳුනුම්පත් අංකය :.............................................නිකුත් කළ දිනය :..................................
උපන් දිනය :.............................................දුරකථන අංකය :..................................
ගණුදෙණුකරු අංකය:.............................................

(III) සම්පූර්ණ නම :..........................................................................................................
..........................................................................................................
ලිපිනය :..........................................................................................................
..........................................................................................................
හැඳුනුම්පත් අංකය :.............................................නිකුත් කළ දිනය :..................................
උපන් දිනය :.............................................දුරකථන අංකය :..................................
ගණුදෙණුකරු අංකය:.............................................

(පෞද්ගලිකව මා / අප දෙදෙනාම/ අප දෙදෙනාගෙන් කෙනෙකු යන්න සරිලන සේ සටහන් කරන්න.)

❖ ............................................. විසින් මුදල් ආපසු ලබාගන්නවා ඇත. අපෙන් කවර කෙනෙකු වුවද මියගිය විට ඒ මියගිය තැනැත්තාගේ නියෝජිතයින්ගෙන් කරුණු නොවිමසා අප ගිණුමෙහි ශේෂව ඇති මුදල් අප අතරෙන් ජීවත්ව සිටින අයට ගෙවිය හැකි වනවා ඇත.

..............................
කළමණාකරු

**මෙහි පසුපිටෙහි සඳහන් නීති සහ රෙගුලාසි කියවා තේරුම්ගත් බවත් ඒවා පිළිපැදීමට එකඟ වූ බවත් මෙයින් සහතික කරමි/කරමු.**

**සාක්ෂි:**
නම:........................................................
ලිපිනය: ..................................................

........................................................
සාමදාන විනිශ්වයකාර/ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු
ප්‍රසිද්ධ නොතාරිස් හෝ සමිතියේ සාමාජිකයෙක්

මීට හිතවත්,

.......................................
.......................................
.......................................
ආදර්ශ අත්සන(න්)

E140/Nish/Stati/stenc/account

# මුදල් ඉතිරි කිරීමේ තැන්පත් ගිණුම් පිළිබඳ රෙගුලාසි

## (තනිතනිව හෝ හවුල්ව)

01. මුදල් ඉතිරි කිරීමේ තැන්පත් ගිණුම් පිළිබඳ ව්‍යාපාරික කටයුතු කරන වේලාවල් සමිතිය විසින් ප්‍රසිද්ධ කර දක්වනු ලබන වේලාවන්ය.

02. මුදල් ඉතිරි කිරීමේ තැන්පත් ගිණුම් විවෘත කිරීම සඳහා එවන ඉල්ලුම්පත් සමිතිය විසින් සපයනු ලබන විශේෂ පෝර්මවල ලියා සම්පූර්ණ කර භාරදිය යුතුය.

03. ඕනෑම ප්‍රමාණයක් දක්වා වැඩි මුදලක් තැන්පත් වශයෙන් භාරගනු ලැබේ.

04. ගිණුම්කරුට ලැබෙන සෑම ණයක්ම දෙනු ලබන්නේ මෙම ගිණුමට බැර කිරීමෙන්.

05. සමිතිය සමඟ ගණුදෙනු කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන සෑම ආදායමක්ම මෙම ගිණුම් මාර්ගයෙන් සාමාජිකයාට අයිති කරනු ඇත.

06. මෙම ගිණුමෙන් සතියකට තෙවතාවක් මුදල් ආපසු ගැනීමට හැකිය. මෙයට හැර තවද හදිසි අවස්ථාවලදී ප්‍රධාන කළමණාකරුගේ අවසරය පිට මුදල් ආපසු ගැනීමට පුළුවන.

07. දෙදෙනෙකුගේ හෝ ඊට වැඩි දෙනෙකුගේ හෝ නම්වලට හවුල්ව මුදල් තැන්පත් කළ හැකිය. මේ මුදල් ඒ දෙදෙනාට හෝ සියලුම දෙනාට හෝ ඒ අයවලුන්ගෙන් එක් කෙනෙකුට හෝ ඊට වැඩි දෙනෙකුට හෝ ඒ අය අතුරෙන් ජීවත්ව සිටින්නන්ට හෝ ආපසු ගත හැකිය.

08. ගිණුමක් විවෘත කිරීම සඳහා වුවමනා අඩුම ගණන රු.................../- ක් වේ. ඊට පසුව භාරගනු ලැබෙන අඩුම තැන්පත් මුදල රු:50/- ක් වේ. රු:100/-ට වඩා ශේෂයක් නැති ගිණුමක් එම මුදල් තැන්පත් කළ අයට එය ආපසු ගෙවා කවර වේලාවක වුවද, සමිතියට එම ගිණුම වසා දැමිය හැක.

09. ගිණුම්කරු නමට ලැබෙන රේඛිත චෙක්පත් පමණක් ඉතිරි කිරීමේ ගිණුමෙහි තැන්පත් කළ හැක. (මුදල් චෙක්පත් හැර)

10. ජනවාරි සිට මාර්තු මස දක්වා ද, අප්‍රේල් සිට ජූනි මස දක්වා ද, ජූලි සිට සැප්තැම්බර් මස දක්වා ද, ඔක්තෝම්බර් සිට දෙසැම්බර් මස දක්වා ද ඇති කාර්තු ඇතුළත දී හෝ මසකට එක්වරක් ලෙස බැංකුවේ අභිමතය පරිදි පවත්වාගෙන එනු ලබන අඩුම ශේෂයන්ට පොලී ගෙවනු ලැබේ.

11. තැන්පත් කරනු ලබන මුදල් හා ආපසු ගන්නා මුදල් සටහන් කරනු ලබන පාස් පොතක් එක් එක් මුදල් ගරන්පත් කරන්නාට, නොමිලයේ සමිතිය සපයනවා ඇත. ශාඛා කළමණාකරුගේ හෝ වගකිවයුතු නිළධාරියෙකුගේ සම්පූර්ණ අත්සන රහිත පාස් පොතේ සටහන්ව ඇති කිසිම මුදලක් ගැන සමිතිය විසින් වගකීම භාරගනු නොලැබේ. මුදල් තැන්පත් කරන්නන් සමිතයෙන් පිටවී යෑමට පෙර පාස්පොත් පරීක්ෂා කර බලා එහි කර ඇති සටහන් නිවැරදි යයි සෑහීමට පත්විය යුතුය.

12. කවර කෙනෙකු විසින් වුවද හොර අත්සන් තැබීමේ හේතුවෙන් හෝ කවර කෙනෙකුගේ වුවද වංචනික වැඩක් හෝ සිදුවී තිබුනේ වුවද එය නොසලකා පාස්පොත් ද මුදල් මුදල් තැන්පත් කළ තැනැත්තාගේ යයි අදහස් කෙරෙන අත්සන් සහිත මුදල් ආපසු ලබාගැනීමේ පෝරමය ද ඉදිරිපත් කරන තැනැත්තෙකුට සමිතිය විසින් මුදල් ගෙවූ අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් එම මුදල් තැන්පත් කර ඇති තැනැත්තා වෙත ඇති සියලුම වගකීම් වලින් සමිතිය නිදහස් වේ.

13. ගිණුම්කරු මියගිය විටෙක තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමේ දී හෝ පාස් පොතක් නැති වූ විටක දී නැවත අලුත් පාස්පොතක් ලබා ගැනීමට අවශ්‍ය වූ විටක දී නියමිත ආකෘති පත්‍රයෙන් යුත් දිවුරුම් පෙත්සමක් බැංකුව නියම කරනු ලබන අතිරේක ලිපි ලේඛණ ද සමගින් ශාඛා කළමණාකාර තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන්පසු බැංකු ශාඛාවේ පොත්වල සඳහන් ගණන් හිලව් අනුව පිළියෙල කරන ලද අලුත් පොතක් මුදල් තැන්පත් කළ අය වෙත බැංකුව නිකුත් කරනවා ඇත. මේ පාස්පොතේ සඳහන් ගණන් හිලව් මුදල් තැන්පත් කළ තැනැත්තා විසින් භාරගත යුතුය. අලුතෙන් පාස් පොතක් නිකුත් කිරීම සඳහා රු:................./- ගාස්තුවක් අයකරනු ලැබේ.

14. කවර වේලාවක වුවද මේ රෙගුලාසි වෙනස් කිරීමට ද ඊට වෙන රෙගුලාසි එකතු කිරීමට ද මාසයකට අඩු නොවන කාලයක් කල් ඇතුව ප්‍රසිද්ධ ලෙස දැනුම් දී පොලී ප්‍රමාණය වෙනස් කිරීමට ද බලය සමිතිය වෙත භාරගනු ලැබේ. එසේ දැනුම් දුන් කාලය අවසානයේ දී තමන්ගේ ගිණුමෙහි ශේෂව ඇති සම්පූර්ණ මුදල යම් මුදල් තැන්පත් කළ තැනැත්තෙකු ආපසු ලබාගෙන නොසිටියේ නම් ඉහත සඳහන් පරිදි වෙනස් කරන ලද හෝ සංශෝධනය කරන ලද හෝ රෙගුලාසි පිළිගැනීමට ද ඊට යටත්ව කටයුතු කිරීමට ද ඔහු එකඟවී සිටින්නකු වශයෙන් සළකනු ලැබේ.